# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන)

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින්
2020 සැප්තැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2020 සැප්තැම්බර් මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[3 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම පනතේ 2 වන වගන්තියේ සඳහන් කරන ලද යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් පනවා අය කර ගනු ලැබිය යුතු බද්ද වැඩි කිරීමය.

# වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 61/2019

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 2020 අංක    දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2019 දෙසැම්බර් මස 6 දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

*2011 අංක 18 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) 2 වන වගන්තියේ සඳහන් කරන ලද යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් පනවා අය කර ගනු ලැබිය යුතු බද්ද-

(අ) 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව 2015 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 5.0 ක අනුප්‍රමාණයක වූ බද්දක්;

(ආ) 2016 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව 2019 දෙසැම්බර් මස 5 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට 7.5 ක අනුප්‍රමාණයක වූ බද්දක්;

(ඇ) 2019 දෙසැම්බර් මස 6 වන දින හෝ එදිනට පසුව සියයට 10 ක අනුප්‍රමාණයක වූ බද්දක්,

ලෙස ගණනය කළ යුතු ය.".

වලංගු කිරීම.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, 2019 දෙසැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන සහිතව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බදු අය කරනු ලබන හෝ එකතු කරනු ලබන අවස්ථාවක දී නිසි අධිකාරී බලය සහිතව ක්‍රියා කර ඇති ලෙස සහ ක්‍රියා කරමින් සිටිනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර, එම බදු අය කිරීම හෝ එකතු කිරීම, සියලු කාර්යය සඳහා වලංගු ලෙස සිදුකර ඇති සහ සිදු කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු ය. එම බදු අය කිරීම හෝ එකතු කිරීම සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයාට එරෙහිව පවරනු ලබන සියලු සිවිල් හෝ අපරාධ නඩුවලින් රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා මෙයින් හානිපූරණය කර තබනු ලැබේ:

එසේ වුව ද, ඉහත කී කාලසීමාව තුළ දී, මේ පනතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට එකතු කරන ලද යම් බදු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ගනු ලැබූ තීරණයක් හෝ නියෝගයක් සම්බන්ධයෙන් යම් අධිකරණයක විභාග වෙමින් පවතින යම් නීති කෘත්‍යයක් සඳහා ඉහත කී විධිවිධාන බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.